264

දුර්ලභ

# විවෘත වෙළඳ ප්‍රතිපත්තියේ බලපෑම නිසා දේශීය අර්තාපල් ගොවියාගේ ආර්ථික හා සමාජීය තත්ත්වය කෙරෙහි හා යෙදවුම් බෙදා හැරීමේ පද්ධතිය තුළ සිදුවී ඇති විචලතා පිළිබඳ අධ්‍යයනයක්.

එස්. ඇපාසිංහ

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 264 |
| වර්ග අංකය | |

කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ
ආර්ථික විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති
පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදි.

2000 සැප්තැම්බර්

# සාරාංශය


නිෂ්පාදන වියදමට සරිලන මිලකට කෘෂි නිෂ්පාදන අලෙවි කර ගැනීමේ අපහසුව පසුගිය වකවානුව තුළදී දේශීය කෘෂි නිෂ්පාදකයා මුහුණ පෑ ප්‍රධානතම කෘෂි ගැටළුව බවට පත් වෙමින් තිබුණි. විවෘත ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය වෙළඳපොළ තුළ අර්තාපල්, බී ළූණු වැනි කෘෂි නිෂ්පාදන සුලභවීම මීට හේතු වූ බව විවිධ මාධ්‍ය ඔස්සේ හෙළිදරව් කෙරිනි. විවෘත ආනයන ප්‍රතිපත්ති හා ආශ්‍රිත මේ කෘෂි නිෂ්පාදන අලෙවි ගැටලුව, අර්තාපල් වගාකරුවන්ගේ සමාජ - ආර්ථික තත්ත්වයේ හා යෙදවුම් බෙදාහැරීමේ පද්ධතිය තුළ කුමන අන්දමේ ගැටළු සහගත තත්ත්වයන් ජනිතවී ඇත්ද යන්න පිළිබඳව පර්යේෂණාත්මක ඇගයීමක් සිදු කිරීමට මෙහිදී උත්සාහ දරා ඇත.

ශ්‍රී ලංකාවේ අර්තාපල් වගා බිම් බහුලව හමුවන බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළින් තෝරා ගත් ගොවි පවුල් 110 කින් එක් රැස් කළ මූලික දත්ත මෙන්ම අර්තාපල් වගාව සම්බන්ධයෙන් ප්‍රකාශිත ද්විතීයික දත්ත සරල සංඛ්‍යානමය විශ්ලේෂණ තුළින්, අධ්‍යයන අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා භාවිතා කර ඇත.

මෙම අධ්‍යයනය තුළින් හෙළිදරව් වන්නේ ගුණාත්මක බීජ හිඟය හා පාංශු සරු බව හීනවීම නිසා ඒකීය ක්ෂේත්‍ර ඵලයකින් නෙලා ගත හැකි අස්වනු ප්‍රමාණය අඩුවෙමින් පවතින අතරතුර, නිෂ්පාදන වියදම ද ඉහළ යාම හේතුවෙන් අඩුමිලට වෙළඳපොළට අර්තාපල් සැපයීමට දේශීය ගොවියා අසමත්වී ඇති බවයි. මීට පිළියමක් ලෙස අඩුමිලට අර්තාපල් ආනයනය කිරීම දේශීය වගාව බිඳ වැටීමට පදනම සපයා ඇත.

ක්ෂේත්‍ර අධ්‍යයනය මඟින් හෙළිදරව් වන්නේ ගොවීන්ගේ ජීවන රටාව කෙරෙහි අර්තාපල් වගාවේ බිඳ වැටීම බලපා ඇති බවයි. නිවාස සංවර්ධනය, ගෘහ භාණ්ඩ මිලදී ගැනීම, පවුලේ සෞඛ්‍ය හා අධ්‍යාපන තත්ත්වයන්ගේ ප්‍රගතිය කෙරෙහි අර්තාපල් වගාව ඉවහල් වූ ආකාරයත්, අර්තාපල් ආනයනය ඇරඹූ 1994 න් පසු යුගය තුළ ඉහත සශ්‍රිකත්වය පිරිහෙමින් පැවතුන ආකාරයත් මෙහිදී හඳුනා ගත හැක. එමෙන්ම ඉතිරිකිරීම්, ණය ලබාගැනීම හා ණය ආපසු ගෙවීමේ කුටුම්භ ප්‍රතිශතයන්ගේ විශාල අඩුවීමක් දක්නට ලැබේ. ගොවීන්ගේ ස්ථාවර වත්කම් රාජ්‍ය බැංකු වෙත උකස් කිරීම හා සින්න වීම්, රැකියා හිඟය, අඩු ආදායම් බෝග වගා කිරීමේ නැඹුරුව යනාදි කරුණු තුළින් ගොවි ජනතාවගේ ජීවන මට්ටමේ පිරිහීම තවදුරටත් අවබෝධ කර ගත හැක.

බීජ ඇතුළු යෙදවුම් බෙදා හැරීමේ පද්ධතිය තුළ බෙදා හැරීමේ හා මිලදී ගැනීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව මෙන්ම යෙදවුම් අලෙවියේ සැලකිය යුතු අඩුවීමක් කෙරෙහිද වගාව බිඳ වැටීමට බලපා ඇති බව පෙනේ. මෙම අර්බුදයෙන් මිදීම සඳහා ගත හැකි පියවරවල් සාකච්ඡා කිරීම සඳහා අවසාන පරිච්ඡේදය වෙන්වී ඇත. මෙහිදී ආනයන සීමා කිරීම්, ව්‍යාප්ති සේවා ශක්තිමත් කිරීම හා මූල්‍ය අංශය කාර්යක්ෂම කිරීම යනාදි නිෂ්පාදනය දිරිගන්වන සුළු

ප්‍රතිපත්තිමය තීරණ ගැනීම රාජ්‍ය අංශයේ කාර්ය භාරය ලෙස හඳුනා ගෙන ඇත. පාරිභෝගිකයා මෙන්ම නිෂ්පාදකයා ද ආරක්ෂා වන පරිදි සාධාරණ මිලකට අර්තාපල් අලෙවි කිරීම සඳහා නිෂ්පාදන වියදම අවම කිරීමේ ක්‍රම හඳුන්වාදීම කෙරෙහි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දායකත්වය අත්‍යාවශ්‍යවී ඇත.

*************

22-11-2003